'විදුරාව': විද්‍යාත්මක සාක්ෂරතාවයෙන් යුත් ජාතියක් බිහිකිරීමේ වසර 50 ක මෙහෙවර

පී. ආර්. එම්. පී. දිල්රුකෂි



ජාතික විද්‍යා පදනමේ (NSF) ඉතිහාසය

ජාතික විද්‍යා පදනම (NSF) දශක පහකට වැඩි කාලයක් පුරා විහිදුණු කීර්තිමත් ඉතිහාසයකට හිමිකම් කියන වර්තමානයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයකි. එය රටේ විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වූ පර්යේෂණ හා සංවර්ධනය සඳහා සෘජු දායකත්වයක් සැපයීම සඳහා පිහිටුවන ලද ආයතනයකි. ජාතික විද්‍යා පදනමේ ගමන ආරම්භ වන්නේ 1968 අංක 9 දරන පාර්ලිමේන්තු පනත යටතේ ජාතික විද්‍යා කවුන්සිලය (NSC) පිහිටුවීමත් සමඟය. ජාතික විද්‍යා කවුන්සිලයේ පළමු සභාපති ලෙස මහාචාර්ය ශ්‍රීමත් නිකලස් ආටිගල මහතා පත්කළ අතර එම මහතාගේ ප්‍රධානත්වයෙන් සමාරම්භක රැස්වීම 1968 මැයි 28 වන දින පැවැත්විණි. 1981 දී, ජාතික විද්‍යා කවුන්සිලය, ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (NARESA) ලෙස ප්‍රතිව්‍යූහගත කරන ලදී. එහි විෂය පථය විද්‍යාව සමඟ ස්වාභාවික සම්පත් සහ බලශක්තිය ඇතුළත් කරමින් තවදුරටත් පුළුල් කරන ලදී. මෙම පරිවර්තනය ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ විද්‍යාත්මක පර්යේෂණ ඒකාබද්ධ කිරීම සනිටුහන් කරයි.

මෙම පනතින් ජාතික විද්‍යා කවුන්සිලයට (NSC) පර්යේෂණ සඳහා අරමුදල් සැපයීම සහ පහසුකම් සැපයීම සඳහා පමණක් නොව, මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීමට සහ රට තුළ විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමටද බලය පැවරිණි. 1969 සැප්තැම්බර් මාසයේදී, ආචාර්ය සී. ආර්. පානබොක්කේ මහතා සභාවේ ප්‍රථම පූර්ණකාලීන ප්‍රධාන විධායක නිලධාරියා ලෙස රාජකාරී භාර ගත්තේය.

1968 - ජාතික විද්‍යා කවුන්සිලය (NSC)	1968 අංක 9 දරන පනත යටතේ පිහිටුවන ලද **NSC** විද්‍යා ප්‍රතිපත්ති සහ සම්බන්ධීකරණය සඳහා වූ ශ්‍රී ලංකාවේ පළමු ජාතික ආයතනය විය. මහාචාර්ය ශ්‍රීමත් නිකලස් ආටිගල මහතාගේ සභාපතිත්වයෙන් ඇරඹුණු මෙම ආයතනය පිහිටුවීම මගින් රටේ විද්‍යාත්මක සංවර්ධනය ක්‍රමවත් වැඩපිළිවෙලක් ඔස්සේ සිදුකිරීම සඳහා අඩිතාලම දැමින.
1981 - ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (NARESA)	ජාතික විද්‍යා කවුන්සිලය **NARESA** ලෙස ප්‍රතිව්‍යූහගත කරන ලද අතර එහි විෂය පථය ස්වාභාවික සම්පත් සහ බලශක්තිය ඇතුළත් කිරීම මගින් පුළුල් කරන ලදී. මෙය ජාතික සංවර්ධනයේ දී විද්‍යාත්මක ප්‍රවේශයක වැදගත්කම පිළිබිඹු කරන ලදි.
1994 - විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පාර්ලිමේන්තු පනත අංක 11	පර්යේෂණ සහ නවෝත්පාදන ශක්තිමත් කිරීම සඳහා නවීන ආයතනයක් සඳහා නීතිමය රාමුවක් සපයන ලදි. විද්‍යාව ජනප්‍රිය කිරීම.අධ්‍යාපනය සහ ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා **NSF** කේන්ද්‍රස්ථානය බවට පත්විය.
1998 - ජාතික විද්‍යා පදනම (NSF)	මූලික සහ ප්‍රයෝගික පර්යේෂණ යන දෙකම ආරම්භ කිරීම උදෙසා පහසුකම් සැලසීම සහ සහාය දීම සඳහා 1994 - විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත අංක 11 මගින් ප්‍රතිපාදන සලසන ලද අතර විද්‍යාව ප්‍රචලිත කිරීම. විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහා කේන්ද්‍රස්ථානය බවට **NSF** පත් කරමින් එහි කාර්යභාරය තවදුරටත් පුළුල් කරන ලදි.
ජාතික විද්‍යා පදනමේ (NSF) හි වර්තමාන කාර්යභාරය	අද වනවිට **NSF** අංශ හතක් 07 හරහා ක්‍රියාත්මක වේ. එනම් පර්යේෂණ අංශය ද තාක්ෂණ අංශය ද විද්‍යා ප්‍රචලිත කිරීමේ අංශය ද විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය ද ජාත්‍යන්තර කටයුතු අංශය ද සඟරා ප්‍රකාශන අංශය ද සහ ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානයි එහි මූලික කාර්යභාර අතර විද්‍යා පර්යේෂණ සඳහා අරමුදල් සැපයීම.**STEM** අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම. විද්‍යාව ප්‍රචලිත කිරීම, ප්‍රතිපත්ති පර්යේෂණ, ශ්‍රී ලංකාව ගෝලීය විද්‍යාත්මක ජාල සමඟ සම්බන්ධ කිරීම සහ ලංකාවේ විද්‍යා පර්යේෂණ ජාත්‍යන්තර තලයට ගෙන යාම වේ.


රූපය 1: ජාතික විද්‍යා පදනමේ (NSF) ඓතිහාසික පරිණාමය



ආචාර්ය සී. ආර්. පානබොක්කේ:
ජාතික විද්‍යා පදනමේ ප්‍රථම ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ආචාර්ය පානබොක්කේ මහතා ශ්‍රී ලංකාවේ විද්‍යා අධ්‍යාපනය සහ විද්‍යාව ප්‍රචලිත කිරීම ඉදිරියට ගෙන යාම සඳහා දූරදර්ශී නායකත්වයක් සපයා දුන්නේය. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පාංශු විද්‍යාඥයකු වූ ඔහු, විද්‍යාත්මක දැනුම අධ්‍යයන ක්ෂේත්‍රයේ සීමාවන් ඉක්මවා සමාජයට ගෙන යාමට මෙන්ම, ශිෂ්‍යයන්, ගුරුවරුන් සහ මහජනතාව අතර විද්‍යාත්මක සාක්ෂරතාව වර්ධනය කිරීමට ද මූලික දායකත්වයක් ලබා දුන්නේය. ඔහුගේ කැපවීම, විද්‍යාත්මක චින්තනය හා විමර්ශනාත්මක ආකල්පයන් පෝෂණය කරන සංස්කෘතියක් ගොඩනැගීමට හේතු වූ අතර, එය අදත් අනාගත පරපුර විද්‍යාව උගෙනීම සඳහා ප්‍රේරණය කරමින් පවතී.



මහාචාර්ය ශ්‍රීමත් නිකලස් ආටිගල:
අභාවප්‍රාප්ත ශ්‍රීමත් නිකලස් ආටිගල මහතා 1968 සිට 1970 දක්වා ජාතික විද්‍යා කවුන්සිලයේ පළමු සභාපතිවරයා ලෙස සේවය කළේය.


Bulletin of the National Science Council of Sri Lanka

Bulletin Advisory Panel : Osmund Jayaratne (Chairman), Carlo Fonseka, Derek Scheckman, K. T. D. de Silva, P. Sattampanpillai, Lyn de Alwis, Nimala Amarasuriya (editor)

Publication : Quarterly

Comment
1 — Of Science and Technology by R. D. B. Wijesekera

Feature Articles
2 — Leather in our National lives by V. Nayudamma
4 — [illegible]
5 — IJ not out at the SLAAS headquarters by S. S. Vedanayagam
6 — On-going projects and affairs of the Atomic Energy Authority, by W. A. Amarasiri


Research in Progress
7 — Coconut Research Institute
8 — Tea Research Institute

News
9 — International News
10 — Scientists in the News
11 — NSC Activities
11 — CISIR Activities
12 — Distinguished Visitors
13 — Meetings


Book News
13 — Publications

Manuscripts
14 —

Vidurava Vol. 1 No. 1 June 1976 Price 3.00



රූපය 2: පළමු විදුරාව බුලටිනයේ පටුන සහ කවරය



මහාචාර්ය ඔස්මන්ඩ් වික්‍රම ජයරත්න:
අභාවප්‍රාප්ත විද්‍යා ජ්‍යෝති මහාචාර්ය ඔස්මන්ඩ් වික්‍රම ජයරත්න ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ භෞතික විද්‍යාඥයෙක්, වාමාංශික දේශපාලනඥයෙක් සහ ශාස්ත්‍රාලිකයෙක් විය. ඔහු ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ සභාපතිවරයා ලෙස සේවය කළ අතර (1972-1977) දක්වා ශ්‍රී ලංකා ජාතික විද්‍යා කවුන්සිලයේ (NSC) සභාපතිවරයා විය. ඔහුගේ NSC හි ධුර කාලය තුළ, විදුරාව විද්‍යා බුලටිනය ආරම්භ කරන ලද අතර ඔහු බුලටිනයෙහි කර්තෘ මණ්ඩලයේ සභාපතිත්වයද දැරීය.



ආචාර්ය වයි. නායුදම්මා:
ආචාර්ය යැලවර්ති නායුදම්මා 1922-1985 යනු සම්භාවනීය ඉන්දියානු විද්‍යාඥයෙකු සහ හම් තාක්ෂණවේදියෙකු වූ අතර හම් ප්‍රධාන කර්මාන්තයක් වන ඉන්දියාවේ සහ විදේශ රටවල පුළුල් ලෙස ගෞරවයට පාත්‍ර වූ විද්‍යාඥයෙකු විය. ඔහු විද්‍යාත්මක හා කාර්මික ඉන්දියාවේ පර්යේෂණ කවුන්සිලයේ CSIR අධ්‍යක්ෂ ජෙනරාල් සහ ජවාහර්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ උපකුලපති ලෙස සේවය කළේය.

විද්‍යාව ප්‍රජාව වෙත ගෙන යාම: විදුරාව යුගයේ උදාව

1976 දී ආරම්භ කළ දා සිට, විදුරාව විද්‍යා බුලටිනය ජාතික විද්‍යා පදනමේ (NSF) ප්‍රමුඛ ප්‍රකාශනයක් ලෙස විද්‍යාව සැමට යන ප්‍රවේශය ඔස්සේ මහජනතාව ඉලක්ක කර වසරේ සෑම කාර්තුවකම සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ (රූපය 2). පසුගිය දශක පහ තුළ, එය සාමාන්‍ය මුද්‍රිත බුලටිනයක සිට 1997 දී ජාතික වශයෙන් පිළිගත් විද්‍යා සඟරාවක් දක්වා පරිණාමය වීම සැලකිය යුතු සන්ධිස්ථානයක් සලකුණු කරයි. අද වන විට විදුරාව ශ්‍රී ලංකාවේ මහජනතාව අතරට විද්‍යාව සන්නිවේදනය කරන ප්‍රමුඛ වේදිකාවක් වන අතර ගත වූ 50 වසර තුළදී විද්‍යා දැනුම, කුතුහලය, නවෝත්පාදනය, නව තාක්ෂණය ආදී විවිධ මාතෘකා ඔස්සේ සියලු වයස් කාණ්ඩ එකතු කරන සහ නව දැනුමෙන් සහ අමතක වී ගිය පාරම්පරික දැනුම වර්තමානයට උපයෝගී කරගත හැකි දැනුමෙන් පෝෂණය කරන මුද්‍රිත මාධ්‍යයක් ලෙස කටයුතු කරයි.

1976 ජූනි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද 'විදුරාව' සඟරාවේ මංගල කලාපය ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා ප්‍රකාශනය එළිදැක්වීම සලකුණු කළේය. මහාචාර්ය ඔස්මන්ඩ් ජයරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුත් උපදේශක මණ්ඩලයක් විසින් මෙම ප්‍රකාශනය මෙහෙයවන ලද අතර, මහාචාර්ය කාලෝ ෆොන්සේකා, ඩෙරික් ෂොක්මන්, කේ. ටී. ඩී. ද සිල්වා, පී. සිත්තම්පරපිල්ලේ සහ ලින් ද අල්විස් වැනි කීර්තිමත් විද්වතුන් පෙළක් එහි සාමාජිකයෝ වූහ.

නිර්මලා අමරසූරිය මහත්මිය පළමු කලාපයේ සංස්කාරක ලෙස කටයුතු කළාය.

මුල් අවධියේ විදුරාව වසරකට නිකුතු 3 ක් ලෙස විවිධ මාතෘකා ඔස්සේ ප්‍රකාශයට පත් කරන ලද අතර, විද්‍යාත්මක දැනුම එදිනෙදා ජීවිතයට සම්බන්ධ කර ගත හැකි අන්දම, විද්‍යා අධ්‍යයනය පිළිබඳ මහජන අවබෝධය ප්‍රවර්ධනය, ලංකාවේ එවකට විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන විසින් සිදුකරනු ලබන පරීක්ෂණ පිළිබඳ විවරණ, විශේෂාංග ලිපි සහ නව විද්‍යා හා තාක්ෂණ දැනුමින් මහජනතාව යාවත්කාලීන කිරීම සඳහා සලසන ලද ලිපි වලින් සමන්විත විය.

පළමු විදුරාව බුලටිනයේ ආරම්භක ලිපිය මහාචාර්ය ආර්. ඕ. බී. විජේසේකර විසින් රචනා කරන ලද අතර, එය විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ඔහුගේ අදහස් සහ එය රටේ සංවර්ධනය සඳහා යොදා ගත හැකි ආකාරය ඉදිරිපත් කළ අතර විදුරාව ප්‍රකාශනය කිරීම තුළින් විද්‍යා කවුන්සිලය බලාපොරොත්තු වන්නේ කුමක්ද සහ අනාගත දැක්ම කුමක්ද යන්න පිළිබඳවද කරුණු ඇතුළත් විය. මුල් ලිපියට පසුව විශේෂාංග ලිපි, පර්යේෂණ ප්‍රගතිය, පුවත්, අලුතින් ප්‍රකාශනය කරන ලද පොත් පිළිබඳ විස්තර ආදී ලිපි මාලාවක් අඩංගු විය. එම ලිපි ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශ කර තිබූ අතර එක් ලිපියක් පමණක් සිංහල මාධ්‍යයෙන් ප්‍රකාශ කර තිබුණි.

මෙම මංගල කලාපයේ සිත්ගන්නාසුළු අංගයක් වූයේ එහි පළමු විශේෂාංග ලිපිය වන 'අපේ ජාතික ජීවිතවල හම්' යන ලිපිය 1971 දී ඉන්දියාවේ විද්‍යාව හා තාක්ෂණයට ඔහු කළ කැපීපෙනෙන දායකත්වය වෙනුවෙන් පද්ම ශ්‍රී සම්මානයෙන් පිදුම් ලැබූ කීර්තිමත් ඉන්දියානු විද්‍යාඥයෙකු සහ හම් කර්මාන්තය පිළිබඳ තාක්ෂණවේදියෙකු වන ආචාර්ය වයි. නායුදම්මා විසින් රචනා කර තිබීමයි. මෙම ලිපියෙන් විද්‍යාව සමාජය සමඟ සම්බන්ධ කිරීම සඳහා ඔහුගේ ජීවිත කාලය පුරාම සිදු කර ඇති කැපවීම පිළිබිඹු වූ අතර විද්‍යාත්මක දැනුම ජාතික සංවර්ධනයට දායක විය හැකි ආකාරය පෙන්වා දෙන ලදී. එදිනෙදා යෙදීම්, කල්පැවැත්ම, ආර්ථික වැදගත්කම සහ හම්වල සංස්කෘතික වැදගත්කම පිළිබඳ ඔහුගේ ලිපිය මගින් සාකච්ඡා කර තිබුණි. ආචාර්ය නායුදම්මා ජීවනෝපායන් වැඩිදියුණු කිරීමේදී සහ රටක කාර්මික සංවර්ධනය සඳහා විද්‍යාවේ සහ තාක්ෂණයේ වැදගත් කාර්යභාරය සඳහන් කළේය. එවැනි කීර්තිමත් ජාත්‍යන්තර විද්‍යාඥයෙකුගේ ලිපියක් පළමු කලාපයටම ඇතුළත් කිරීම මගින් විදුරාව හි මංගල වෙළුමට වටිනාකමක් සහ හොඳ පිළිගැනීමක් එක් කළහ. එලෙසම විදුරාව ප්‍රකාශනයේ එක් අරමුණක් වූ දේශීය හා ජාත්‍යන්තර දෘෂ්ටිකෝණයන් හරහා විද්‍යාත්මක දැනුවත්භාවය ඇති කිරීම යන්න සාක්ෂාත් වූ අතර එය එම දැක්ම තවදුරටත් ශක්තිමත් කළේය. විදුරාව සඟරාවේ මංගල කලාපය 1976 වෙළුම 1 ද්විභාෂා ආකෘතියකින් ප්‍රකාශයට පත් කරන ලද අතර, එහි සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා දෙකෙන්ම ලිපි ඇතුළත් විය. එමගින් ශ්‍රී ලාංකික පාඨක ප්‍රවේශය පුළුල් කිරීම සිදු විය. එහි කැපී පෙනෙන දායකයින් අතර, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ විද්‍යාඥයෙකු, පර්යේෂකයෙකු සහ විද්‍යා ලේඛකයෙකු වන ආචාර්ය උපාලි එම්. සේනානායක හැඳින්විය හැක. ඔහු රට තුළ විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ විද්‍යාඥයෙකු වන අතර විදුරාව මංගලකලාපය සඳහා 'විද්‍යාවේ ප්‍රතිලාභ උපරිම කිරීම' යන මාතෘකාව යටතේ රචිත ලිපිය ඉතා වැදගත් ස්ථානයක් ගනී. මෙම ලිපියෙන් ඔහු විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේ වටිනාකම ගැනත්, රටක සංවර්ධනය සඳහා එම දැනුම යොදාගත හැකි අන්දම

අවුරුදු 50 ක විදුරාවේ කර්තෘ මණ්ඩලය

වර්ෂය	දශක පහක කර්තෘ මණ්ඩලය
1976-1992	නිමලා අමරසූරිය මහත්මිය
1993-1996	ඒ.ඩබ්.ජේ. කරුණාසිංහ මහතා සහ අමල් උඩවත්ත මහතා
1997-2000	ඒ.ඩබ්.ජේ කරුණාසිංහ මහතා, අමල් උඩවත්ත මහතා, තක්ෂිලා ද සොයිසා මහත්මිය
2005-2006	ආචාර්ය කුමාර හිරිඹුරේගම, ආචාර්ය එස්.ආර් ක්‍රිෂ්ණරාජා
2007-2012	තුසිත මලලසේකර මහතා, අශෝක ද සිල්වා මහතා, ආචාර්ය ශලිනි රංගනාදන් මහත්මිය, මහාචාර්ය එස් මෝහන්දාස් මහතා, ආචාර්ය කදිරවේටිපිල්ලේ මහතා
2013-2014	තුසිත මලලසේකර මහතා, අශෝක ද සිල්වා මහතා, ආචාර්ය කදිරවේටිපිල්ලේ මහතා
2015-2017	තුසිත මලලසේකර මහතා, අශෝක ද සිල්වා මහතා, ආචාර්ය ආර්. සෙන්තිල්නිති මහත්මිය
2018-2024	තුසිත මලලසේකර මහතා, අශෝක ද සිල්වා මහතා, ආචාර්ය එන්. කාර්තිකේයන්, ආචාර්ය ගෞරි මූර්ති
2025-2026	තුසිත මලලසේකර මහතා, අශෝක ද සිල්වා මහතා, ආචාර්ය ගෞරි මූර්ති, ආචාර්ය සීතා අයි. වික්‍රමසිංහ

ගැනත් සාකච්ඡා කර තිබුණි. මෙම පළමු කලාපයේ 'පර්යේෂණ ප්‍රගතිය' යන අංශය යටතේ පොල් පර්යේෂණ ආයතනය (CRI) සහ තේ පර්යේෂණ ආයතනය (TRI) ඇතුළු ප්‍රධාන ජාතික පර්යේෂණ ආයතන විසින් සිදු කරනු ලබන පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ යාවත්කාලීන කිරීම් සපයා තිබූ අතර, ඒවා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා ආර්ථික සංවර්ධනයට ලබාගත හැකි දායකත්වය ද පෙන්වා දෙන ලදී. ජාත්‍යන්තර තලයේ පුවත් යටතේ මෙම පළමු කලාපයේ 1975 නොබෙල් ත්‍යාගලාභීන් පිළිබඳ තොරතුරු, යුනෙස්කෝ මිනිසා සහ ජෛවගෝල (MAB) වැඩසටහනේ ප්‍රගතිය සහ සිකුරු ග්‍රහලෝකය වෙත සෝවියට් අභ්‍යවකාශ ගවේෂණ මෙහෙයුම් ඇතුළු ගෝලීය වැදගත්කමක් ඇති තොරතුරුද, ජාතික තලයේ විද්‍යා ක්ෂේත්‍රයේ සිදුවූ පුවත් පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කර තිබීම අගය කළයුතු එළඹුමක් ලෙස හැඳින්විය හැක.

විද්‍යාත්මක ලිපි, දේශීය පර්යේෂණ ජයග්‍රහණ, විද්‍යා ප්‍රතිපත්ති, අධ්‍යාපනික ලිපි සහ ජාත්‍යන්තර විද්‍යාත්මක තොරතුරු ආදී පුළුල් පරාසයක් ආවරණය කරමින් ආරම්භ කරන ලද විදුරාව බුලටිනය ශ්‍රී ලංකාවේ විද්‍යාව ජනප්‍රිය කිරීම, මහජනතාවගේ විද්‍යාත්මක සාක්ෂරතාවය ඉහළ දැමීමටත්, එදිනෙදා භාවිතයට සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අවශ්‍ය විද්‍යාව හා තාක්ෂණය දැනුම ලබා දීමටත් පුළුල් මෙහෙයුමක් අද වනවිටත් නොකඩවා සිදුකරමින් පවතී. මෙම ඇරඹුම විද්‍යාත්මක ප්‍රජාවත් සාමාන්‍ය මහජනතාවත් සම්බන්ධ කරන පාලමකට දැමූ ශක්තිමත් පදනමක් ලෙස හැඳින්විය හැක.පළමු කලාපය ඉංග්‍රීසි සහ සිංහල භාෂාවලින් පමණක් ප්‍රකාශයට පත් වූවද දෙවන කලාපයට CISIR හි ඊ.ඊ. ජෙයරාජ් විසින් රචිත දෙමළ භාෂාවෙන් ලියන ලද ලිපියක් ඇතුළත් වූ අතර, එහි ඔහු ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය සහ එහි අනාගත ප්‍රතිවිපාක පිළිබඳ තම අදහස් දක්වා තිබිණි. තවද මෙම කලාපයේ "සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා ප්‍රතිපත්ති" යන මාතෘකාව යටතේ NSC හි සභාපති මහාචාර්ය ඔස්මන්ඩ් ජයරත්න සහ මහාචාර්ය කාලෝ ෆොන්සේකා අතර පැවැති සාකච්ඡාවක් මත පදනම් වූ සිංහල භාෂාවෙන් ලියවුන ලිපියක් ද ඇතුළත් විය.

විදුරාව හි ලේඛකයින්, සංස්කාරකවරුන්, පරිවර්තකයින්, නිර්මාණකරුවන් සහ යතුරු ලියනය කරන්නන් පසුගිය වසර 50 තුළ මෙම විද්‍යා සඟරාව තිරසාරව පවත්වාගෙන යාමට සහ එහි ගුණාත්මකභාවය පවත්වා ගැනීමට ඉමහත් දායකත්වයක් ලබා දී ඇත.


මුල් වසරවල කර්තෘ කමිටුව සහ පසුව, විද්‍යා අධ්‍යාපන කමිටුවත්, අදවනවිට විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරී කමිටුවත්, වාර්ෂිකව සුදුසු තේමාවන් තෝරා ගැනීමටත්, අදාළ ලිපි ලිවීම සඳහා සුදුසු කතෘවරුන් තෝරා ගැනීමටත් විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශයට වටිනා මඟ පෙන්වීමක් ලබා දෙයි.

සංස්කාරකවරුන්ගේ කාර්යභාරය සැලකීමේදී, නිර්මලා අමරසූරිය මහත්මිය 1976 විදුරාව ආරම්භයේ සිට 1992 දක්වා බුලටින් හි සංස්කාරකවරිය ලෙස වසර 16 ක් සේවය කරමින් විද්‍යා සන්නිවේදනය සඳහා ශක්තිමත් පදනමක් සකස් කළාය.

සිංහල සංස්කරණයේ වත්මන් සංස්කාරකධුරය දරන තුසිත මලලසේකර මහතා සහ ඉංග්‍රීසි සංස්කරණයේ සංස්කාරකධුරය දරන අශෝක ද සිල්වා මහතා 2017 සිට සුවිශේෂී කාර්යභාරයක් කරමින් සිටී. ඔවුන් දෙදෙනාම, සංස්කාරක පදවිය දැරීමට පෙර ඔවුන්ගේ විෂයානුබද්ධ විශේෂඥතාව අනුව විදුරාව සඳහා කතෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයින් ලෙසද දායකත්වයක් ලබා දී ඇත.



මහාචාර්ය එම්.ටී.එම්. ජිෆ්රි:
ශ්‍රී ලංකාව තුළ විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා මහාචාර්ය එම්. ටී. එම්. ජිෆ්රි මහතා විශිෂ්ට දායකත්වයක් ලබා දුන් අතර, ඔහු පුළුල් දැක්මකින් සහ කැපවීමකින් යුතුව ජාතික විද්‍යා පදනමෙහි විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරී කමිටුව මෙහෙයවීය. එතුමාගේ නායකත්වය යටතේ ජාතික විද්‍යා පදනම මහජනතාව අතරට විද්‍යාව ගෙනයාම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් තව දුරටත් පුළුල් වූ අතර, "විදුරාව" Vidurava සඟරාව විවිධ පාඨක පිරිස් වෙත විද්‍යාත්මක තොරතුරු බෙදා හරින ප්‍රබල වේදිකාවක් බවට පත් විය. ක්‍රියාකාරී කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ කාලසීමාව තුළ, ආයතනයේ මහජනතාව අතර විද්‍යා ප්‍රචලිත කිරීමේ වැඩසටහන් වෙනුවෙන් ජාතික මට්ටමේ හා ජාත්‍යන්තර මට්ටමේ සම්මාන කිහිපයක්ම දිනා ගැනීමට එතුමාට හැකි විය.



ආචාර්ය ජයන්ත වත්තේවිදාන:
මහාචාර්ය ජෙෆ්රි ගේ අභාවයෙන් අනතුරුව, ජාතික විද්‍යා පදනමේ (NSF) විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරී කමිටුවේ සභාපති ධුරයට ආචාර්ය ජයන්ත වත්තේවිදාන මහතා පත් වූ අතර, එතැන් සිට අද දක්වාම මහත් කැපවීමකින් එම වගකීම ඉටු කරමින් සිටී. ඔහුගේ දූරදර්ශී නායකත්වය යටතේ කමිටුවේ ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් තවදුරටත් පුළුල් වූ අතර, විද්‍යා සන්නිවේදනයේ ප්‍රමුඛ වේදිකාවක් ලෙස "විදුරාව" සඟරාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඔහුගේ මඟ පෙන්වීම අගය කළ යුතුය. එමෙන්ම පාසල් මට්ටමින් විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහාත් විද්‍යාව ජනතාව අතරට සමීප කිරීමටත් වැදගත් මෙහෙවරක් ඉටු කර ඇත. විද්‍යාත්මක දැනුමෙන් සවිබල ගැන්වුණු විද්‍යා සාක්ෂරතාවයෙන් පිරිපුන් සමාජයක් ගොඩනැඟීම හා රට පුරා විද්‍යාව ප්‍රචලිත කිරීමේ ජාතික විද්‍යා පදනමේ අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා තවදුරටත් ඔහු ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිත කිරීමේ කමිටුවේ සභාපති ලෙස නායකත්වය සපයමින් අගනා මෙහෙවරක් සිදුකරමින් සිටී.

විදුරාව - විද්‍යාව ප්‍රචලිතකිරීමේ වසර 50 ක ගමන් මග

පසුගිය දශක පහ තුළ, විද්‍යාව හා තාක්ෂණයේ රටේ වෙනස්වන ප්‍රමුඛතා පිළිඹිබු කරමින්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විද්‍යා සඟරාව බවට විදුරාව පරිණාමය වී ඇත. 1976 දී ජාතික විද්‍යා කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද විද්‍යා බුලටිනයෙහි මුල් කලාප කෘෂිකර්මය, පරිසරය, සෞඛ්‍යය සහ මහවැලි යෝජනා ක්‍රමය වැනි ජාතික සංවර්ධන ව්‍යාපෘති වැනි ප්‍රායෝගික තේමාවන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම පිටපත් ගුරුවරුන් සහ ග්‍රාමීය ප්‍රජාවන් විසින් බහුලව භාවිත කරන ලද අතර, විද්‍යාව එදිනෙදා ජීවිතයට භාවිත කිරීම සඳහා මහජනතාව හුරුකිරීමට මෙය මහත් රුකුලක් වූ බව අද වැඩිහිටියන් වී සිටින බොහෝ දෙනාගේ පිළිගැනීමයි.

1980 දශකයේ අග භාගයේ සිට 2000 දශකය දක්වා, විදුරාව බහුභාෂා සංස්කරණ (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) දක්වා ව්‍යාප්ත වූ අතර, පරිගණකකරණය, ජෛව තාක්ෂණය සහ පාරිසරික අභියෝග වැනි නැඟී එන මාතෘකා ආවරණය කළේය. වැදගත් මහජන සෞඛ්‍ය දැනුවත්භාවය ලබා දුන් ඒඩිස් වෛරස 1993 සහ ගැටුම් සහ සංහිඳියාවේ යථාර්ථයන් තුළ විද්‍යාව ස්ථානගත කළ එවකට රට මුහුණදුන් යුද්ධය පිළිබඳ ගැටලු 1994 සාකච්ඡාවට යොදා ගත් කාලීන ගැටලු අතරට ඇතුළත් විය. මෙම කාල පරිච්ඡේදය තුළ, විදුරාව සඟරාව NSF හි පාසල් විද්‍යා තරග සහ පාසල් විද්‍යා සංගම් සමඟ සමීපව සම්බන්ධ වී, තරුණ කුසලතා පෝෂණය කරමින් සහ විද්‍යා සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා දායකත්වයක් සපයන ලදී. ශ්‍රී ලංකාවේ විද්‍යාව ප්‍රචලිත කිරීමේ පුරෝගාමියෙකු වූ මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මහතා, 1990-1997 කාලය තුළ විද්‍යා

විදුරාව දශක පහක නොනිමි ගමනේ විශේෂ සන්ධිස්ථාන

1976 - 1985: මූලික පදනම

- ජාතික විද්‍යා කවුන්සිලය යටතේ ප්‍රකාශනයක් ලෙස විදුරාව දියත් කිරීම.
- මුල් කාලීන තේමාවන්: විද්‍යාව හා තාක්ෂණය, ආහාර සහ පෝෂණය, මහවැලි සංවර්ධනය.
- විද්‍යාව එදිනෙදා ජීවිතයට යොදා ගැනීම සඳහා පාසල් සහ ග්‍රාමීය ප්‍රජාවන් දැනුවත් කිරීම ප්‍රධාන අරමුණ ලෙස ගෙන ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීම.

1986 - 2000: ව්‍යාප්තිය පුළුල් කිරීම


- 1997 දී බුලටින් සිට සම්පූර්ණ විද්‍යා සඟරාව දක්වා සංක්‍රමණය වීම.
- බහුභාෂා සංස්කරණ (සිංහල, දෙමළ, ඉංග්‍රීසි).
- කාලීන ගැටලු සාකච්ඡාවට ගැනීම: ඒඩිස් වෛරස (1993) යුද්ධය සහ සාමය වෙළුම (1994).
- NSF හි පාසල් විද්‍යා සමාජ තරග පෙළගැස්ම.

2001 - 2015: නවීකරණය


- ගෝලීය අභියෝග කෙරෙහි අවධානය යොමු කිරීම: දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය සහ තිරසාර සංවර්ධනය.
- NSF හි පාසල් විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගය සමඟ ඒකාබද්ධ වීම.
- STEM අධ්‍යාපනය සහ අනාගත STEM රැකියා වෙළඳපොළ පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.

2016 - 2026: ඩිජිටල් යුගයක් සඳහා පරිවර්තනය

- මාර්ගගත සංස්කරණ සඳහා යොමු වීම සහ අන්තර්ක්‍රියාකාරී විශේෂාංග.
- තේමාවන්: කෘතිම බුද්ධිය, නැනෝ තාක්ෂණය, COVID-19, STEAM අධ්‍යාපනය, වෙබ් ප්‍රකාශනය සඳහා යොමුවීම.
- දැනුමේ සහ තාක්ෂණයේ පැහැදිලි පරිවර්තනයක් පෙන්නුම් කිරීම (දෙමාපියන් 1976 ගණන්වල පාංශු සාරවත් බව පිළිබඳ ලිපි සිහිපත් කරන අතර, අද දරුවන් රොබෝ විද්‍යාව සහ AI ගවේෂණය කරයි).



විදුරාව 19 වෙළුම - 2 කලාපය



විදුරාව 35 වෙළුම විශේෂ කලාපය



විදුරාව 41 වෙළුම - 2 කලාපය

අධ්‍යාපන කමිටුවේ සභාපතිවරයා ලෙස ද විදුරාව කර්තෘ මණ්ඩලයේ සභාපතිවරයා ලෙසද මහඟු කාර්යභාරයක් ඉටුකළේය. 1997 දී ඔහුගේ හදිසි අභාවය සිදු වූ අතර රට තුළ විද්‍යාව ප්‍රචලිත කිරීමට ඔහු විසින් සිදුකළ මෙහෙවර ඇගයීම උදෙසා විදුරාව විශේෂ කලාපයක් (වෙළුම 19 අංක 2) ඔහු වෙනුවෙන් කැප කරන ලද අතර එය "මහාචාර්ය නන්දදාස කෝදාගොඩ අනුස්මරණ කලාපය" ලෙස නම් කරන ලදී. 2018 දී, "ජාතික විද්‍යා පදනම: විද්‍යාව හා තාක්ෂණය තුළින් රට ඉදිරියට ගෙන යාම" යන තේමාව යටතේ NSF 50 වන සංවත්සරය සැමරීම සඳහා තවත් විශේෂ කලාපයක් (35 වන වෙළුම විශේෂ කලාපය) ප්‍රකාශයට පත් කරන ලදී.ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිතකිරීමේ කමිටුවල සභාපතිවරුන් ලෙස කටයුතු කළ මහාචාර්ය එම්. ටී. එම්. ජෙෆ්රි සහ ආචාර්ය ජයන්ත වත්තෙවිදානගේ මහතා විදුරාවේ ප්‍රගමනය සඳහා ඉමහත් ලෙස දායක වුණි.

21 වන සියවසේදී, දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය, තිරසාර සංවර්ධනය සහ ඩිජිටල් පරිවර්තනය වැනි ගෝලීය තේමාවන් ආමන්ත්‍රණය කරමින්, විදුරාව ප්‍රකාශනය කරන ලදී.
එලෙසම වර්තමාන ලෝකයේ සිදුවන තාක්ෂණික සහ සමාජ පරිවර්තන, උදාහරණ ලෙස කෘත්‍රිම බුද්ධිය, අවමවාදය, STEAM අධ්‍යාපනය වැනි සංකල්ප මහජනතාව අතරට විශේෂයෙන් පාසල් ප්‍රජාව අතරට ගෙන යාම සඳහා කටයුතු කරන ලදී. එලෙසම මහජනතාව මුහුණපාන ආහාර සුරක්ෂිතතාව, (COVID-19) වැනි කාලීන ගැටලුත් තේමාවන් ලෙස ගෙන විදුරාව ප්‍රකාශන නිකුත් කරන ලද අතර දේශීය දැනුම සහ සාම්ප්‍රදායික දැනුමේ භාවිතයන් සඟරාවේ කල් පවතින වටිනාකම, විවිධ වයස් කාණ්ඩ සහ වෘත්තිකයන්ගේ පාඨකයින් සඟරාව වටා එක් වී ඇත්තේ විද්‍යා සාක්ෂරතාව ඉහළ නැංවීමටත්, තරුණ කුසලතා පෝෂණය කිරීමටත්, විද්‍යාඥයින්, අධ්‍යාපනඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ මහජනතාව අතර සංවාදයක් ඇති කිරීමටත් එහි ඇති හැකියාව තුළ ය. විද්‍යාව විවිධ භාෂාවලින් සහ ආකෘතිවලින් ඉදිරිපත් කිරීමෙන්, එය දිවයින පුරා පන්ති කාමර, නිවාස සහ ප්‍රජාවන් වෙත ළඟා වී ඇති අතර, දැනුම රසායනාගාරවලට පමණක් සීමා නොවී එදිනෙදා ජීවිතයේ කොටසක් බවට පත් කිරීමට හැකිවී ඇත.

අද, විදුරාව පරම්පරා යා කරන පාලමක් ලෙස තව දුරටත් ක්‍රියා කරමින් පවතින අතර දෙමව්පියන්ට 1970 ගණන්වල රටේ පාංශු සාරවත් බව ගැන කියවූ ආකාරය මතකයට නඟන විට 2020 ගණන්වලදී ඔවුන්ගේ දරුවන් රොබෝ විද්‍යාව සහ AI තාක්ෂණය සමඟ සම්බන්ධ කිරීමට විදුරාව සමත් වී ඇත. අද වන විට විදුරාව විද්‍යා සඟරාව ලෝකයේ සිදුවන විද්‍යාත්මක පරිවර්තන සමඟ අනුගත වෙමින් ඉදිරිය පිළිබඳ නිවැරදි දැක්මකින් ඒ සඳහා සාර්ථක ලෙස මුහුණ දිය හැකි පරම්පරාවක් ගොඩනැගීමේ විශ්වසනීය හඬක් ලෙස තම මෙහෙවර නොවනස්ව සාර්ථකව ඉදිරියටත් ගෙන යෑමට කටයුතු කරන ජාතියේ ප්‍රමුඛ සඟරාවක් ලෙස එහි කාර්යභාරයේ නොනිමි ගමන තවත් දිගු කාලයක් ගමන් කරනු ඇත.

"විදුරාව" රටේ ජනතාව විද්‍යා දැනුමෙන් පෝෂණය කරමින් චිරාත් කාලයක් පවතීවා කියා ආශිර්වාද කරමු.



ආචාර්ය දිල්රුක්ෂි රණතුංග
අංශ ප්‍රධානී
විද්‍යාව ප්‍රචලිතකිරීමේ අංශය
ජාතික විද්‍යා පදනම

